# මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව
# மனிதவலு வேலைவாய்ப்புத் திணைக்களம்
# Department of Manpower & Employment

## කාර්ය සාධන වාර්තාව - 2013
## செயலாற்றுகை அறிக்கை - 2013
## Performance Report - 2013




**ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය**

**මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව**

**9 වන මහල, සෙත්සිරිපාය (දෙවන අදියර)**

**බත්තරමුල්ල.**

# මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
# மனிதவலு வேலைவாய்ப்புத் திணைக்களம்
# Department of Manpower & Employment

# කාර්ය සාධන වාර්තාව
## செயலாற்றுகை அறிக்கை
## Performance Report

# 2013

# පටුන


## 1. හැඳින්වීම

1.1. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව.....1

1.2. රාජකාරී ඉටු කිරීමේ විෂය පථය.....1

1.3. උපාය මාර්ගික දිශානතිය.....2

1.4. දෙපාර්තම්න්තුවේ ගමන් මඟ.....3

1.5. දීර්ඝ කාලීන ඉලක්ක.....3

1.6. අරමුණු.....4

## 2. සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩල තොරතුරු

2.1. අනුමත සහ 2013-12-31 දිනට සිටි සේවක සංඛ්‍යාව.....6

2.2. මානව සම්පත් සංවර්ධන සහකාර වරුන්ගේ තොරතුරු සාරාංශය - 2013.....7

2.3. පාලන අංශය.....8

2.4. කාර්ය මණ්ඩල තොරතුරු.....8

2.5. කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය, සුභසාධනය හා පුහුණුව.....8-9

2.6. සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් අංශය.....10

2.7. 2013 වර්ෂයේ මූල්‍ය පරිපාලන සාරාංශය.....11-12

2.8. රැකියා නිර්මාණ සහ වෘත්තීය මාර්ගෝපදේශ අංශය.....12

2.9. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්.....12-13

2.10. විශේෂිත වැඩසටහන්.....13

## 3. කාර්ය සාධනය 2013

3.1. 2013 වර්ෂයේ වැඩසටහන් වල සමස්ථ ප්‍රගතිය.....13

3.2. රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්.....14

3.3. ග්‍රාමීය රැකියා ව්‍යපෘතිය හා ක්ෂුද්‍ර මුල්‍ය වැඩසටහන.....15-18

3.4. මිනිස්බල සැලසුම් සංවර්ධන සහ පර්යේෂණ අංශය.....19

3.5. ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකයේ සමීක්ෂණයන් සඳහා වියදම් වූ මුදල් සහ ඉතිරි මුදල්.....20-21

3.6. රැකියා සේවා මධ්‍යස්ථාන.....22-25

3.7. දෙපාර්තමේන්තු ප්‍රකාශණ.....25

# 1. හැදින්වීම

## 1.1. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව එවකට කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ 2010 පෙබරවාරි 2 වන දින අංක 1640/31 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2010 ජනවාර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටවනු ලද දිවයිනේ සමස්ථ මානව සම්පතෙහි වර්ධනය උදෙසා වෘත්තිකයින් බිහිකිරීමේ අරමුණ කරගත් දෙපාර්තමේන්තුවකි.

## 1.2. රාජකාරී ඉටු කිරීමේ විෂය පථය

මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් ඉටුකරලීමට බලාපොරොත්තු වේ.

- ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ සහ ප්‍රවර්ධන කටයුතු.
- වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම.
- ශ්‍රම වෙළඳපොල තොරතුරු එක්රැස් කිරීම විශ්ලේෂණය සහ බෙදා හැරීම.
- එවකට රැකියා පියස මඟිනුත් වර්තමානයේදී එය මහජන රැකියා සේවාව (Public Employment Service – PES ) හරහා ඉටු කරනු ලබන සියළු කටයුතු.

මේ අනුව මෙම දෙපාර්තමේන්තුව මඟින් මානව සම්පත තුල තිබෙන ශක්තීන් හා හැකියාවන් මෙන්ම ඒ හරහා අදාළ පුද්ගලයන්ට ලඟාකර ගත හැකි ඉහත ධනාත්මක වටිනාකම් හඳුනාගෙන ඒ සඳහා වැදගත්, ඉහළ මෙන්ම ප්‍රයෝජනවත් වටිනාකමක් එකතුකල හැකි ආකාරයකට ඔවුන්ගේ වෘත්තීය අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය මඟ පෙන්වීම , ඒ සඳහා ඉඩකඩ ලබාදීම, මාර්ග සකස් කර දීම, විවිධ රැකියා සඳහා පෙළඹවීම, හැකියාව වර්ධනය,සුළු පරිමාණ ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, රැකියා ක්ෂේත්‍රය තුල සිටින රැකියා හිමියන් හා ඉල්ලුම්කරුවන් එකිනෙකා මුණ ගැස්වීම සහ දිවයින තුළ ශ්‍රම වෙළඳ පොළ තොරතුරු එකතු කිරීම, විශ්ලේෂණය කිරීම හා අවශ්‍යතා මත එම තොරතුරු ලබා දීම ආදී කටයුතු රාශියක් ඉටුකල හැකිය.

## 1.3. උපාය මාර්ගික දිශානතිය

**දැක්ම**

**ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්**

**මෙහෙවර**

*පුළුල් නිපුනතාවයෙන් යුත් ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩ නැගීම සහ අපේ මානව සම්පත් වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම.*

## 1.4. දෙපාර්තමේන්තුවේ ගමන් මඟ

2010 වර්ෂයේ පිහිටුවන ලද මෙම දෙපාර්තමේන්තුව මඟින් මේ දක්වා වෘත්තීය මාර්ගෝපදේශනයට හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනයට අදාළව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියක් තුළින් ප්‍රතිලාභීන් 50000 කට අධික සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබා දෙමින් මෙරට ආර්ථිකය ශක්තිමත් කරලීම සඳහා රැකියා විරහිත තරුණ තරුණියන් 10000 කට අධික පිරිසකට පෞද්ගලික අංශයේ රැකියා ලබා දීම සඳහා කටයුතු කර ඇත.

එමෙන්ම අනුමත කාර්ය මණ්ඩලය 700 ක් වුවද තනතුරු පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පැවති මෙම දෙපාර්තමේන්තුව එම පුරප්පාඩු රාජකාරී සඳහා බාධාවක් නොවන අයුරින් රැකියා ලබාදීමේ වැඩපිළිවෙල යටතේ බඳවාගත් උපාධිධාරී කණ්ඩායම් තුළින් ඒවා සම්පූර්ණ කර ගනිමින් මේ වන විට පුරප්පාඩු සංඛ්‍යාව 190 ක් වැනි ප්‍රමාණයකට අඩුකර ගෙන ඇත. ඒ අනුව ආයතනයේ කටයුතු කරගෙන යාමේදී අත්‍යවශ්‍ය වන සේවාවන්ට අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය කටයුතු වර්තමානයේදී සිදු කරමින් පවතී.

## 1.5. දීර්ඝ කාලීන ඉලක්ක

ගෝලීය වශයෙන් පවතින තරඟකාරීත්වයන් හා අභියෝගයන් හමුවේ එම තත්වයන්ට ගැලපෙන පරිදි හා ඊට අනුගත වන පරිදි ශ්‍රම බලකායක් සකස් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වේ. ඒ අනුව ලෝක මට්ටමේ ශ්‍රී ලාංකීක ශ්‍රම බලකායක් ඇති කිරීම දැක්ම කරගත් මෙම දෙපාර්තමේන්තුවේ දිගුකාලීන ඉලක්ක පහත පරිදි වර්ගීකරණය කල හැකිය.

1. ගෝලීය වශයෙන් තරගකාරී, නිපුණතාවයෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ගොඩනැංවීම.
2. විරැකියාව අවම කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
3. සංවිධිත පරිපූර්ණ ශ්‍රම වෙළඳ පොළ තොරතුරු පද්ධතියක් ඇතිකිරීම.




## 1.6. දෙපාර්තමේන්තුවේ අරමුණු

ඉහත ඉලක්කයන් ඉටුකරගැනීම බලපැවැත්වන්නේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම තුලිනි.

1. ජාතික මිනිස්බල ප්‍රතිපත්තිය සකස්කර, ප්‍රතිපත්තිය සහ අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. කුසලතා නොගැලපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටළුව විසඳීම
3. වර්තමාන ශ්‍රමබලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
4. මිනිස්බල සැලසුම් කිරීම, සංවර්ධනය හා පුරෝකථනය.
5. අවිධිමත් අංශය සංවර්ධනය.
6. පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂකයින් පෙළඹවීම
7. නිදහස් රාජ්‍ය රැකියා සේවය ලබාදීම.
8. අවධානමට ලක්වී ඇති කණ්ඩායම්, ආබාධිත පුද්ගලයින් සහ ඌන සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයින් සඳහා මිනිස්බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම.
9. ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියළුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම.
10. දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ නැඹියාවන් පුරෝකථනය

මේ අයුරින් විරැකියාව අවම කිරීම හා යහපත් රැකියා ඇතිකිරීම යන සත්කාරයයන් ඉටුකරගැනීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව සිය මානව සම්පත් උපයෝගී කර ගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

## 2. සංවිධාන ව්‍යුහය




1. ග්‍රාමීය රැකියා හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන
2. අවිධිමත් අංශයේ රැකියා ප්‍රවර්ධන වැඩසටහන
3. රැකියා යෝග්‍යතා සංවර්ධන වැඩසටහන
4. රැකියා සමාජ වැඩසටහන
5. රුකියා පොළ

1. වෘත්තීය මාර්ගෝපදේශ තොරතුරු පද්ධති සැකසීම හා බෙදාහැරීම
2. වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යනය හා පර්යේෂණ
3. . වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1. වැඩසටහන් සැලසුම් කිරීම මෙහෙයවීම හා ඇගයීම
2. ක්ෂේත්‍ර වැඩසටහන් සම්බන්ධීකරණය
3. නව වැඩසටහන් හඳුනාගැනීම හා සැලසුම් කිරීම.

1. සාමාන්‍ය පරිපාලනය
2. කාර්ය මණ්ඩල හා ආයතන කටයුතු
3. දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන කටයුතු
4. ගබඩා සේවය
5. සුභසාධන කටයුතු

1. වාර්ෂික සැලසුම් සැකසීම හා වාර්තා සැකසීම.
2. කාර්ය මණ්ඩල සංවර්ධනය
3. ප්‍රගති ඇගයීම් කටයුතු
4. අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය
5. දෙපාර්තමේන්තු ප්‍රකාශන

1. ශ්‍රම වෙළඳපොළ ප්‍රවනතා අධ්‍යනය
2. ශ්‍රම වෙළඳපොළ තොරතුරු එකතු කිරීම
3. විශ්ලේෂණය කිරීම හා බෙදාහැරීම

1. මිනිස්බලය පුරෝකථනය කිරීම.
2. ආංශික මිනිස්බල සැලසුම් සැකසීම
3. අදාළ ආයතන සමහ සම්බන්ධීකරණය මගින් සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම
4. මිනිස්බල සංවර්ධනය සඳහා ආදාළ ප්‍රතිපත්ති හා යෝජනා ක්‍රම සැකසීම හා ක්‍රියාත්මක කිරීම

1. ජාතික රැකීරක්ෂා සේවා ජාලයක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
2. රැකියා සේවා සපයන ආයතන අතර සම්බන්ධීකරණය

1. දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ කටයුතු

## 2.1. අනුමත සහ 2013-12-31 දිනට සේවක සංඛ්‍යාව

| අනු අංකය | තනතුර | අදාල වන සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.පරි.සේ (විශේෂ) | 1 | 1 | 0 |
| 2 | අධ්‍යක්ෂ (පරිපාලන) | ශ්‍රී.ලං.පරි.සේ I | 1 | 0 | 1 |
| 3 | අධ්‍යක්ෂ(රැකියා නිර්මාණ සහ වෘත්තිය මාර්ගෝපදේශ) | ශ්‍රී.ලං.පරි.සේ I | 1 | 1 | 0 |
| 4 | අධ්‍යක්ෂ(මිනිස්බල සැළසුම් සංවර්ධන සහ පර්යේෂණ) | ශ්‍රී.ලං.පරි.සේ I | 1 | 0 | 1 |
| 5 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී. ලං.ග. සේ I | 1 | 1 | 0 |
| 6 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | ශ්‍රී.ලං.පරි.සේ II/ III | 2 | 1 | 1 |
| 7 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ) | ශ්‍රී.ලං.පරි.සේ II/ III | 2 | 0 | 2 |
| 8 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (රැකියානිර්මාණ,ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ) | ශ්‍රී.ලං.පරි.සේ II/ III | 2 | 2 | 0 |
| 9 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මිනිස්බල සැළසුම් සංවර්ධන හා පර්යේෂණ) | ශ්‍රී.ලං.සැ.සේ II/ III | 1 | 1 | 0 |
| 10 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ) | ශ්‍රී.ලං.සැ.සේ II/ III | 1 | 1 | 0 |
| 11 | පරිපාලන නිලධාරී | රා.කළ.සේ.අධි | 1 | 0 | 1 |
| 12 | භාෂා පරිවර්තක | භෂා පරිවර්තක සේවය 1/11 | 1 | 0 | 1 |
| 13 | වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී | ආශ්‍රිත සේවා | 85 | 33 | 52 |
| 14 | ව්‍යාපෘති නිලධාරී | ආශ්‍රිත සේවා | 3 | 0 | 3 |
| 15 | මානව සම්පත් සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | 570 | 452 | 118 |
| 16 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.සේ.I II, III | 15 | 6 | 9 |
| 17 | රියදුරු | රියදුරු සේවය | 7 | 5 | 2 |
| 18 | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ II/III. | 5 | 5 | 0 |
| | **එකතුව** | | **700** | **509** | **191** |

## 2.2. මානව සම්පත් සංවර්ධන සහකාර වරුන්ගේ තොරතුරු සාරාංශය - 2013

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් අනුයුක්ත සංඛ්‍යාව | දිස්ත්‍රික් මට්ටමින් අනුයුක්ත සංඛ්‍යව | මුළු සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් පුරප්පාඩු සංඛ්‍යාව | දිස්ත්‍රික් මට්ටමින් පුරප්පාඩු සංඛ්‍යව | අතිරික්ත සංඛ්‍යාව | මුළු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| අම්පාර | 20 | 17 | 02 | 19 | 03 | 03 | - | 06 |
| අනුරාධපුරය | 23 | 10 | 03 | 13 | 09 | 01 | - | 10 |
| බදුල්ල | 15 | 10 | 03 | 14 | 04 | 02 | 1 | 06 |
| මඩකලපුව | 15 | 15 | 04 | 19 | - | - | 3 | - |
| කොළඹ | 13 | 13 | 07 | 20 | - | - | | - |
| ගාල්ල | 19 | 19 | 06 | 24 | 01 | - | 1 | 01 |
| ගම්පහ | 13 | 13 | 09 | 22 | - | - | 4 | - |
| හම්බන්තොට | 12 | 12 | 10 | 22 | - | - | 4 | - |
| යාපනය | 15 | 15 | 05 | 20 | - | - | 1 | - |
| මහනුවර | 20 | 20 | 05 | 25 | - | - | 5 | - |
| කෑගල්ල | 11 | 12 | 08 | 20 | - | - | 4 | - |
| කළුතර | 14 | 14 | 09 | 23 | - | - | 4 | - |
| කුරුණෑගල | 30 | 30 | 08 | 38 | - | - | 13 | - |
| මාතර | 16 | 16 | 11 | 27 | - | - | 4 | - |
| මාතලේ | 11 | 09 | 05 | 14 | 02 | - | -- | 02 |
| මොණරාගල | 11 | 10 | 03 | 13 | 01 | 02 | - | 03 |
| නුවරඑළිය | 05 | 05 | 01 | 06 | - | 02 | - | 02 |
| පුත්තලම | 16 | 14 | 03 | 17 | 02 | - | - | 02 |
| පොළොන්නරුව | 07 | 05 | 01 | 06 | 02 | 03 | - | 05 |
| රත්නපුර | 17 | 17 | 04 | 21 | - | - | 2 | - |
| ත්‍රිකුණාමලය | 11 | 05 | - | 05 | 06 | 03 | - | 09 |
| වව්නියා | 04 | 03 | 02 | 05 | 01 | 03 | - | 04 |
| මන්නාරම | 05 | 02 | - | 05 | 03 | 02 | - | 05 |
| කිළිනොච්චිය | 04 | 03 | 01 | 04 | 01 | 02 | - | 03 |
| මුලතිව් | - | - | - | - | - | 03 | - | 03 |
| එකතුව | | 289 | 123 | 412 | 35 | 26 | 46 | 61 |

මෙහිදී ආයතනයේ කටයුතු සඳහා බාධාවන් ඇති විය හැකි පුරප්පාඩු සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් යොමු කර එම පුරප්පාඩු කඩිනමින් පිරවීම කෙරෙහි අවධානය යොමු විය.ඒ අනුව කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් අපගේ ඉලක්කය වන්නේ හැකිතාක් ඉක්මනින් දැනට අතිරික්තව සිටින නිලධාරීන් පුරප්පාඩුව පවතින දිස්ත්‍රික්ක වෙත යොමු කර වීම හා පවතින පුරප්පාඩු අතරින් සේවා අවශ්‍යතාවය සලකා බලා එම පුරප්පාඩු හැකි ඉක්මනින් පිරවීමයි.

## 2.3. පාලන අංශය

පාලන අංශය යටතේ පහත සඳහන් ඒකකයන් ස්ථාපිත කර ඇත.

I. ආයතන අංශය

II. සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

## 2.4. කාර්ය මණ්ඩල තොරතුරු

නිලධාරීන් අළුතින් බඳවා ගැනීම්

| නම | තනතුර | සේවයට පැමිණි දිනය |
|---|---|---|
| කේ.ඩී.එන්.රංජිත් අශෝක මයා | අධ්‍යක්ෂ ජනරාල් | 2013.12.26 |
| ජී.එච්.ආර්.ගුණවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ | 2013.01.01 |

**නිලධාරීන් ස්ථාන මාරු වීම්**

| නම | තනතුර | ස්ථාන මාරු වූ දිනය |
|---|---|---|
| එස්.එම්.ජී.එන්.ධර්මසේකර මයා | අධ්‍යක්ෂ ජනරාල් | 2013.12.04 |
| ඊ.එස්.ජී.එදිරිසිංහ මයා | අධ්‍යක්ෂ | 2013.06.24 |
| ස්වර්ණා ද සිල්වා මිය | අධ්‍යක්ෂ | 2013.04.10 |

## 2.5. (i) කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය හා සුභ සාධනය

කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම සහ ඔවුන්ගේ සුභ සාධනය ඇති කර ලීම සඳහා පහත කාර්යයන් 2013 වර්ෂය තුළදී ඉටුකර ඇත.

| | අභිප්‍රේරණ / සුභ සාධනය | ප්‍රතිලාභින් |
|---|---|---|
| I. | සේවකයින් ස්ථිර කිරීම් | - මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන් |
| II. | සේවකයින්ගේ වැටුප් වර්ධක ගෙවීම් | - ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්<br>- ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරීන්<br>- ව්‍යාපෘති නිලධාරීන්<br>- වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්<br>- මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන්<br>- රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරීන්<br>- කාර්යාල සේවක සේවය<br>- රියදුරු |
| IV. | අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම් | - නිලධාරීන් 89 ක් සඳහා ලබා දී ඇත. |
| V. | දේපළ ණය ගෙවීම් | - නිලධාරීන් 42 ක් සඳහා ලබා දී ඇත. |
| VI. | ආපදා ණය ගෙවීම් | - නිලධාරීන් 57 ක් සඳහා ලබා දී ඇත. |

## 2.5 (ii) කාර්ය මණ්ඩල පුහුණුව

පුළුල් නිපුණතාවයෙන් යුත් ,ක්‍රියාශීලී හා ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩ නැගීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන සීමිත ප්‍රතිපාදන මත වුවද තම කාර්ය මණ්ඩලය 2013 වර්ෂය තුලදී පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ඇත.

| අංකය | පුහුණුව | ආයතනය | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | මූලික පරිගණක පුහුණුව | ජයසේකර කළමණාකරණ ආයතනය | 1 |
| 2 | වෘත්තිය මාර්ගෝපදේශ සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 33 |
| 3 | උපදේශණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 1 |
| 4 | දෙමල භාෂා පාඨමාලා | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 1 |
| 5 | කාර්යාල කළමණාකරණය හා කාර්යාල ක්‍රම | නිපුණතා සංවර්ධන අරමුදල | 3 |
| 6 | වෘත්තිය මාර්ගෝපදේශ ඩිප්ලෝමා පාඨමාලාව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 16 |
| 8 | ඉංග්‍රීසි භාෂා පුහුණුව | බ්‍රිතාන්‍යය කවුන්සිලය | 45 |
| 9 | කාර්යාල කාර්ය සහායක පුහුණු | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 1 |
| | එකතුව | | **101** |

දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය තුළදී කාර්ය මණ්ඩල පුහුණුව සඳහා රු. 1,833,250.00 වියදමක් දරා ඇත.

## 2.6. සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

### කාර්ය සාධනය - 2013

වැය ශීර්ෂය : 328-1-1-2401/328-1-12401 මූල්‍ය ප්‍රතිපාදනය

| අනු අංකය | වැඩසටහන | ක්‍රියාකාරකම් | ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | මූල්‍ය (වැය කළ) (රු.මි) | භෞතික | |
| | | | | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
| 1 | 2013 වාර්ෂික ප්‍රගති සමාලෝචනය | 2013 වාර්ෂික ප්‍රගතිය සමාලෝචනය කිරීම | 0.103244 | 09 ( පළාත් මට්ටමින් ) | 447 |
| 2 | ප්‍රතිලාභින් කේන්ද්‍රගත කණ්ඩායම් සැසි | දෙපාර්තමේන්තුවේ වැඩසටහන් පිළිබඳ බාහිර පාර්ශවයන් වෙතින් ඇගයීම් ලබා ගැනීම | 0.0424 | 10 | |

## 2.7. 2013 වර්ෂයේ මූල්‍ය පරිපාලන සාරාංශය

| ශීර්ෂය | වැය විස්තරය | අනුමත මූල්‍ය ප්‍රතිපාදන (රු ) | වියදම් කළ ප්‍රමාණය(රු) | 2013 අවසානයේ ඉතිරි (රු) |
|---|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 130000000.00 | 101411835.19 | 28588164.81 |
| 1002 | අතිකාල දීමනා | 500000.00 | 244936.50 | 255063.50 |
| 1003 | වෙනත් දීමනා | 65350000.00 | 58132132.50 | 7217867.50 |
| | ගමන් වියදම් | | | |
| 1101 | දේශීය ගමන් වියදම් | 15000000.00 | 11571850.52 | 3428149.48 |
| 1102 | විදේශීය ගමන් වියදම් | 300,000.00 | 276300.16 | 23699.84 |
| | සැපයීම් | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 3500000.00 | 2689757.96 | 810242.04 |
| 1202 | ඉන්ධන | 4000000.00 | 1585591.35 | 2414408.65 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 50,000.00 | 20000.00 | 30000.00 |
| | නඩත්තු වියදම් | | | |
| 1301 | වාහන | 1200000.00 | 641811.56 | 558188.44 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500000.00 | 477230.56 | 22769.44 |
| | සේවා | | | |
| 1401 | ප්‍රවාහන | 1800000.00 | 480000.00 | 1320000.00 |
| 1402 | තැපැල් හා සන්නිවේන | 2100000.00 | 2019581.66 | 80418.34 |
| 1403 | විදුලිය හා ජලය | 1700000.00 | 424682.90 | 1275317.10 |
| 1404 | කුලී හා ආයතන බදු | 8500000.00 | 8472570.00 | 27430.00 |
| 1405 | වෙනත් | 2500000.00 | 977086.08 | 1522913.92 |
| | මාරු කිරීම් | | | |
| 1506 | රජයේ සේවකයන්ගේ දේපල ණය | 7000000.00 | 6965036.21 | 34963.79 |
| | මූලධන වියදම් | | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 11700000.00 | 9516045.77 | 2183954.23 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 900000.00 | 327005.00 | 572995.00 |
| 2003 | වාහන | 800,000.00 | 797220.25 | 2779.75 |
| | මූලධන වියදම් අත් පත් කර ගැනීම | | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 600,000.00 | 596585.63 | 3414.37 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1000000.00 | 991754.00 | 8246.00 |
| | හැකියා වර්ධනය | | | |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 5757670.00 | 5501454.50 | 256215.50 |
| | වෙනත් මූලධන වියදම් | | | |
| 2502 | වෙනත් ආයෝජන | 6742330.00 | 5565255.40 | 1177074.60 |

## 2.7 (ii). මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ වියදම් සාරාංශය

වැය ශීර්ෂය - 328

| වියදම් වර්ගීකරණය | 13.12.31 | 2013.12.31 දිනට වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පුනරාවර්තන | 244 | 196.39 | 81% |
| ප්‍රාග්ධන | 43.2 | 33.45 | 87% |
| එකතුව | 287.2 | 229.48 | 82% |

## 2.8. රැකියා නිර්මාණ සහ වෘත්තීය මාර්ගෝපදේශ අංශය

අංශයේ අරමුණු

- රැකියා නිර්මාණ සහ ප්‍රවර්ධන කටයුතු
- වෘත්තිය මාර්ගෝපදේශනයට අයත් කටයුතු

මෙම අරමුණු ඉටු කර ගැනීමට අංශයේ ඒකක දෙකකි

**1. රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන ඒකකය** - රැකියා විරහිත තරුණ ප්‍රජාව නිවැරදි රැකියාවන් සඳහා යොමු කිරීමත්, තරුණ ප්‍රජාවගේ රැකියා යෝග්‍යතාව සංවර්ධනය සහ ආවිධිමත් අංශය ප්‍රවර්ධනය තුළින් ව්‍යවසායකින් නගා සිටුවීම සඳහා බල ගැන්වීම

**2. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය** - ශ්‍රම බලකායට එකතුවන දැයේ දරුවන්ට විශේෂයෙන් සා.පෙළ / උ.පෙළ සිසුන් හා විවිධ පාඨමාලා හදාරන්නන් මෙන්ම එසේ නොකරන්නන් සඳහා තම වෘත්තීය ජීවිතය හැඩගස්වා ගැනීම සඳහා වෘත්තීය උපදෙස් ලබා දීම

## 2.9 (i) වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන් :-

01. වෘත්තීය අභියෝග ජයගැනීමේ වැඩසටහන
02. ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන
03. ස්වයං රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන
04. අභ්‍යන්තර උපාධි අපේක්ෂිතයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන
05. බාහිර උපාධි අපේක්ෂිතයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන
06. උසස් පෙළ සිසුන් සඳහා වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන
07. සාමාන්‍ය පෙළ සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන
08. හසර සඟරා දෙකක් ප්‍රකාශයට පත් කිරීම

## 2.9.(ii) රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්

01. රැකියා සමාජ වැඩසටහන
02. ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන
03. පෞද්ගලික අංශයේ රැකියාගත කිරීමේ වැඩසටහන
04. නිදහස් රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන
05. ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ වැඩසටහන
06. ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන
07. අවශ්‍යතාමත පුහුණු වැඩසටහන
08. ග්‍රාමීය රැකියා ව්‍යාපෘතිය හා ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන

## 2.10 විශේෂිත වැඩසටහන්

**මධ්‍යම පළාත් රැකියා අපේක්ෂිතයන් සඳහා තොරතුරු තාක්ෂණය ලබා දීම**

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන සහකාර නිළධාරීන් වන සී. කේ. චන්ද්‍රසෝම හා ආර්. එම්. සී රත්නායක යන මහතුන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තාවක් සලකා ඒ ඇසුරින් සංවිධානය කරන ලද වැඩසටහනකි. මේ වැඩසටහන මගින් මහනුවර තොරතුරු තාක්ෂණ ආයතනය විසින් රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් 800 ක් සඳහා නොමිලේ තොරතුරු තාක්ෂණය ලබාදීම සිදුවිය.

# 3. කාර්ය සාධනය 2013

## 3.1. 2013 වර්ෂයේ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් වල සමස්ථ ප්‍රගතිය

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | වියදම (මිලියන) | |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | සපුරා ගැනීම | ඉලක්කය | සපුරා ගැනීම | ඉලක්කය | සපුරා ගැනීම |
| සාමාන්‍ය පෙළ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 1300 | 1271 | 45500 | 38467 | - | - |
| උසස් පෙළ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 800 | 730 | 24000 | 23471 | - | - |
| ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 24 | 16 | 480 | 340 | 0.03 | 0.0199 |
| වෘත්තීය අභියෝග ජය ගැනීමේ වැඩසටහන | 92 | 92 | 2760 | 3304 | 0.6486 | 0.653371 |
| ස්වයං රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන | 120 | 158 | 3600 | 5235 | 0.21 | 0.236075 |
| බාහිර උපාධි වැඩසටහන | 5 | 5 | 200 | 212 | 0.13775 | 0.13775 |
| අභ්‍යන්තර උපාධි වැඩසටහන | 5 | 2 | 200 | 84 | 0.13775 | 0.05395 |
| වෘත්තීය කාර්ය සාධනය වැඩිදියුණු කිරීම | - | | 5109 | 10188 | - | - |
| වෘත්තීය මාර්ගෝපදේශන සේවා සැපයීම | - | 19676 | 6258 | 21833 | - | - |
| හසර සඟරාව | 4 | 3 | - | - | 0.56 | 0.36292 |
| හඳුනාගත් ක්ෂේත්‍ර සඳහා වෘත්තීයමය ප්‍රකාශන | 1 | - | - | - | 0.2198 | - |
| වැඩසටහන් සඳහා අත්පොත් | - | - | - | - | 1.46141 | 0.765267 |
| පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | - | - | - | - | 0.3 | - |
| ගුරුවරුන් දැනුවත් කිරීමේ නියමු වැඩසටහන | **5** | **4** | **200** | **144** | **0.2** | **0.1257** |

මූලාශ්‍රය - සැලසුම් හා ප්‍රගති මෙමෙයුම් ඒකකය

## 3.2. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන වැඩසටහන් :

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛාව | | රැකියාගත කිරීම් සංඛ්‍යාව | වියදම (මිලියන) | |
|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | සපුරා ගැනීම් | ඉලක්කය | සපුරා ගැනීම් | | ඉලක්කය | සපුරා ගැනීම් |
| රැකියා සමාජ වැඩසටහන | 86 | 85 | 2580 | 2593 | 265 | 1.7802 | 1.1.68941 |
| ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන | 243 | 250 | 24300 | 43529 | 2989 | 1.458 | 1.356335 |
| පෞද්ගලික අංශයේ රැකියාගත කිරීමේ වැඩසටහන | 23 | 22 | 1725 | 2013 | 450 | 0.4416 | 0.211075 |
| නිදහස් රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන | 19 | 26 | 570 | 861 | 57 | 0.21774 | 0.211075 |
| ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ වැඩසටහන | 22 | 12 | 660 | 377 | 109 | 0.517 | 0.230974 |
| ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන | 27 | 48 | 810 | 1405 | - | 0.5548 | 0.810119 |
| අවශ්‍යතාමත පුහුණු වැඩසටහන | 120 | 160 | 2400 | 4073 | - | 0.786 | 0.963474- |
| රැකියා ගවේෂන වැඩසටහන | - | - | - | - | | - | - |
| දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන | 24 | 23 | 1800 | 14101 | 672 | 3.8496 | 1.2815 |
| උද්‍යාන අලංකරණය | 5 | 5 | 125 | 164 | - | 0.2 | 0.176691 |
| සෘජු රැකියාගත කිරීම් | - | - | - | - | 4548 | - | - |
| ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | 10 | 9 | 300 | 289 | 79 | 0.1529 | 0.13595 |
| උද්‍යාන අලංකරණය පිළිබඳ නිලධාරි පුහුණු වැඩසටහන | 1 | 1 | | | | 0.1 | 0.06545 |

## 3.3. ග්‍රාමීය රැකියා ව්‍යාපෘතිය හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභින් | කුඩා කමිටු | ග්‍රාමීය සංගම් | ප්‍රාදේශීය කමිටු සංඛ්‍යාව | දිස්ත්‍රික් ව්‍යවසාය කමිටු සංඛ්‍යාව | කණ්ඩායම් අරමුදල් | නිර්මාණයකළ ව්‍යවස්ථායකයින් සංඛ්‍යාව | ණය ලබාදුන් ප්‍රතිලාභින් සංඛ්‍යාව | ලබාදුන් ණය මුදල | ජනිත වූ රැකියා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගාල්ල | 567 | 46 | 16 | 11 | - | - | 189 | 27 | 620,000.00 | - |
| මාතර | 421 | 47 | 13 | - | - | - | - | 8 | 455,000.00 | 4 |
| කොළඹ | 643 | 119 | 12 | 2 | - | - | - | 232 | - | - |
| මහනුවර | 569 | 57 | 11 | 2 | - | - | 52 | 24 | 4,680,000.00 | - |
| නුවරඑළිය | 201 | 32 | 13 | - | - | - | 38 | 13 | 530,000.00 | - |
| කුරුණෑගල | 760 | 92 | 41 | 5 | - | - | 97 | 108 | 6,625,000.00 | 13 |
| බදුල්ල | 230 | 2 | - | 1 | - | - | 26 | 11 | 650,000.00 | 7 |
| ගම්පහ | 454 | 63 | 24 | 3 | - | - | 80 | 87 | 8,410,000.00 | 14 |
| හම්බන් තොට | 457 | 42 | 16 | 3 | - | - | - | 64 | 15,200.00 | - |
| අම්පාර | 263 | 41 | 3 | - | - | - | - | 40 | 146,000.00 | - |
| පුත්තලම | 221 | 23 | 3 | - | - | - | - | 7 | 350,000.00 | - |
| කෑගල්ල | 558 | 84 | 15 | 2 | - | - | - | 128 | 9,400,000.00 | 32 |

කරු මීළඟ පිටුවට-

පෙර පිටුවෙන්-

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් | කුඩා කමිටු | ග්‍රාමීය සංගම් | ප්‍රාදේශීය කමිටු සංඛ්‍යාව | දිස්ත්‍රික් ව්‍යවසාය කමිටු සංඛ්‍යාව | කණ්ඩායම් අරමුදල් | නිර්මාණයකළ ව්‍යවස්ථායකයින් සංඛ්‍යාව | ණය ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ලබාදුන් ණය මුදල | ජනිත වූ රැකියා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පොළොන්නරුව | 69 | 5 | - | - | - | - | - | 8 | 80,000.00 | - |
| කළුතර | 477 | 23 | 4 | 3 | - | - | 57 | 139 | 3,800,500.00 | - |
| මාතලේ | 297 | 40 | 33 | - | - | - | - | 18 | 690,000.00 | 10 |
| අනුරාධපුර | 242 | 23 | 5 | - | - | - | 17 | 18 | 400,000.00 | 1 |
| රත්නපුර | 563 | 92 | 2 | - | - | - | - | 45 | 2,670,000.00 | - |
| මොණරාගල | 165 | 24 | 6 | 1 | 1 | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | - | - | - | - |
| යාපනය | - | - | - | - | - | - | - | - | - | - |
| වව්නියා | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකලපුව | - | - | - | - | - | - | - | - | - | - |
| එකතුව | 7157 | 855 | 217 | 33 | 1 | - | 556 | 977 | 39,521,700.00 | 81 |

## 3.3.(i) ග්‍රාමීය රැකියා ව්‍යාපෘතිය හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන

| වැඩසටහන | වාර්ෂික ඉලක්ක | සපුරා ගැනීම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ණය මුදල් /කණ්ඩායම් අරමුදල් ප්‍රමාණය(රු.) | සෘජු රැකියා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන ව්‍යවසායකයින් සංඛ්‍යාව | ව්‍යාපෘතිය සඳහා එක් ප්‍රා.ලේ.කා. කින් ව්‍යවසායකයින් 5200 කි. | - | 6397 | - | - |
| ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන කුඩා කමිටු සංඛ්‍යාව | 1040 | 851 | - | - | - |
| ග්‍රාමීය සංගම් සංඛ්‍යාව | 312 | 214 | - | - | - |
| ප්‍රාදේශීය සංගම් සංඛ්‍යාව | 52 | 32 | - | - | - |
| දිස්ත්‍රික් ව්‍යවසායකත්ව කමිටු | 5 | 1 | - | - | - |
| නිර්මාණය කළ ව්‍යවසායකයින් සංඛ්‍යාව | 1285 | - | 586 | - | - |
| ණය ලබා දුන් සංඛ්‍යාව | - | - | 977 | - | - |
| ණය මුදලේ ප්‍රමාණය (රු) | - | - | - | 53,261,500 | - |
| රැකියා අවස්ථා ජනිත කිරීම | 258 | - | - | - | 81 |
| කණ්ඩායම් අරමුදල් ප්‍රමාණය | - | - | - | 1,439,846.25 | - |





(ග්‍රාමීය රැකියා දැනුවත් කිරීමේ වැඩසටහනෙහි අවස්ථාවන්)

❖ අංශයේ නිළධාරීන් සඳහා ලබා දී ඇති පුහුණුවීම්

| පුහුණු වැඩසටහන | පවත්වන ලද ස්ථානය | සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|
| අංශයේ වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් ද්‍රවිඩ මාධ්‍යය නිළධාරීන් පුහුණු කිරීම | පොල්ගොල්ල සමුපකාර පුහුණු මධ්‍යස්ථානය | 43 | රු.265781.00 |
| මා.ස.සං.ස. නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | එලදායිතා ලේකම් කාර්යාලය | 32 | රු. 14720.00 |

❖ දැයට කිරුළ වැඩසටහනට සමගාමීව පවත්වන ලද වැඩසටහන්වල ප්‍රගතිය

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | පුහුණුව ලබා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රැකියාගත කිරීම් සංඛ්‍යාව | වියදම (රු) |
|---|---|---|---|---|
| ජීවනෝපාය සංවර්ධන පුහුණු වැඩසටහන | 59 | 1170 | | 1965585 |
| සෘජු රැකියා ගත කිරීම් | 10 | 850 | | 1052775 |
| වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 10 | 2250 | | 277000 |
| එකතුව | 79 | 4270 | | 3295360 |





(දැයට කිරුළ වැඩසටහනට සමගාමීව පැවැත්වූ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්)

## 3.4. මිනිස්බල සැලසුම් සංවර්ධන සහ පර්යේෂණ අංශය

ජාතික මිනිස්බල සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමත් මිනිස්බල විෂය ක්ෂේත්‍රයට අදාලව ශ්‍රී ලංකාවේ කාලීන සංවර්ධන අවශ්‍යතාවයන්ට සරිලන ලෙස පර්යේෂණ හා සමීක්ෂණ මෙහෙයවීම, ශ්‍රම වෙළදෙපාළ පිළිබඳ පුරෝකතනය.

| අනු අංකය | වැඩසටහන | ක්‍රියාකාරකම් | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (වැය කළ ) (රු.මි) | භෞතික ප්‍රගතිය |
| 01 | දළ ජාතික සංතෘෂ්ටිය පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණය කිරීම, දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම | 0.082726 | 100% |
| 02 | වැඩිහිටි ජනගහනය ශ්‍රම බලකායට දායක කර ගැනිම පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණය කිරීම, දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම | 0.050601 | 70% |
| 03 | ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරි නොවන කාන්තාවන් ශ්‍රම බලකායට සම්බන්ද කර ගැනීම පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණය කිරීම, දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම | 0.009462 | 70% |
| 04 | කලා උපාධිධාරින් රැකියා ගත වීම පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණය කිරීම, දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම | 0.08719 | 70% |
| 05 | ශ්‍රී ලංකාවේ අවිධිමත් අංශයේ රැකියාවල ගුණාත්මකභාවය වැඩි කිරිම පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණය කිරීම, දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම | 0.025 | 70% |
| 06 | පුවත්පත් සමීක්ෂණය | සමීක්ෂණය කිරීම, දත්ත විශ්ලේෂණය හා තොරතුරු බෙදා හැරීම | | 35% |
| 07 | LMI සඟරාව සහ CD සැකසීම | | | 25% |
| 08 | පාසල් පදනම් කොට ගත් සමාජ ආර්ථික දත්ත අත් පොත | තොරතුරු එක් රැක් කිරීම හා සකස් කිරීම. | 0.133 | 80% |
| 09 | මිනිස්බල සැලසුම් සංවර්ධන ක්‍රම වේදයන් පිළිබඳ පුහුණුව | දේශන, පරිගණක ගත ප්‍රායෝගික පුහුණුව මඟින් මිනිස්බල පුරෝකථන හැකියා වර්ධනය | | 50% |

## 3.5. ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකයේ සමීක්ෂණයන් සඳහා වියදම් වූ මුදල් සහ ඉතිරි මුදල්

| වැඩසටහන/ව්‍යාපෘතිය | වැය ශීර්ෂය | වෙන්වූ මුදල රු.මි. | වියදම් වූ මුදල් රු.මි. | ඉතිරි මුදල | මුදල් ඉතිරි වීමට හේතුව |
|---|---|---|---|---|---|
| 1. කලා විෂය ධාරාවෙන් උසස් අධ්‍යාපනය හැදෑරීම රැකියා යෝග්‍යතාවයට බලපාන ආකාරය පිළිබඳ සමීක්ෂණය | 328-1-1-1-2502-1 | 190000 | 76190 | 113810 | දත්ත විශ්ලේෂණය යන කාර්යය බාහිර පාර්ශවයක් වෙත පැවරීමද ඇතුලත්ව මෙම මුදල් ඇස්තමේන්තුව සකස් කරන ලදී. එහෙත් ඇස්තමේන්තුව පිළියෙළ කළ කාලවකවානුවේ එම කාර්යයන් සඳහා පැවති වෙළඳපොළ මිල ගණන් වලට වඩා සත්‍ය වශයෙන්ම එම කාර්යය පවරන කාලවකවානුව වන විට එය ඇස්තමේන්තු කළ වියදමට වඩා වැඩි අගයක් ගනු ලබන බව පෙනී ගිය හෙයින් එම කාර්යයන් බාහිර පාර්ශවයක් වෙත නොපවරා ශ්‍රම වෙළඳපොළ කාර්ය මණ්ඩලය විසින්ම සිදු කරන බැවින් මෙම මුදල් ඉතිරි වීමට හේතු විය. |
| 2. ශ්‍රී ලංකාවේ අවිධිමත් අංශයේ රැකියාවන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම පිළිබඳ වන සමීක්ෂණය | 328-1-1-1-2502-1 | 240000 | 109390.80 | 130609.20 | කුරුණෑගල හා කොළඹ දිස්ත්‍රික්කයේ මානව සම්පත් සංවර්ධන සහකාරවරුන්හට පැවැත්වීමට නියමිතව තිබූ සමීක්ෂණය දැනුවත් කිරීමේ වැඩසටහන නොපවත්වන ලදී.එයට හේතුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැයට කිරුළ ජංගම සේවා ආශ්‍රිත රාජකාරි කටයුතු නිසා මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගැනීමේ අපහසුතාවය පැන නැගුන බැවිනි. ඒ අනුව සමීක්ෂණය සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මාලාව මුද්‍රණය කර ප්‍රශ්නාවලීන් සමඟ බෙදා හරින ලදී.<br>• ඇස්තමේන්තුගත නියැදිය 40 ක් වුවද බදු තැබීමේ ක්‍රමවේදය මත නියැදිය තෝරා ගැනීමේදී එය 30 දක්වා අඩු වීම.<br>ඒ අනුව මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් 10 දෙනෙකුට රු.3000 බැගින් සිදු කරන ගෙවීම අඩු විය.<br>• සමීක්ෂණය සඳහා වෙනත් වියදම් වැය නොවූ බැවින් ඒ සඳහා වෙන් කළ වියදම් වෙන් වූ රු.20000 ක මුදල ඉතිරි වීම.<br>• Stationeries සඳහා වෙන් කළ මුදල් සම්පූර්ණයෙන්ම වියදම් නොවීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය ශ්‍රම බලකායට දක්වන දායකත්වය පිළිබඳ සමීක්ෂණය | 328-1-1-1-2502-1 | 465000 | 50601.19 | 414398.81 | • දත්ත විශ්ලේෂණය සහ වාර්තාව ලිවීම යන කාර්යයන් බාහිර පාර්ශවයක් වෙත පැවරීමද ඇතුලත්ව මෙම මුදල් ඇස්තමේන්තුව සකස් කරන ලදී. එහෙත් ඇස්තමේන්තුව පිළියෙළ කළ කාලවකවානුවේ එම කාර්යයන් සඳහා පැවති වෙළඳපොළ මිල ගණන් වලට වඩා සත්‍ය වශයෙන්ම එම කාර්යය පවරන කාලවකවානුව වන විට එය ඇස්තමේන්තු කළ වියදමට වඩා වැඩි අගයක් ගනී. එබැවින් යථෝක්ත කාර්යයන් බාහිර පාර්ශවයක් වෙත නොපවරා ශ්‍රම වෙළඳපොළ කාර්ය මණ්ඩලය විසින්ම සිදු කරන බැවින් මෙම මුදල් ඉතිරි වීමට හේතු විය.<br>• සමීක්ෂණය සඳහා වෙනත් වියදම් වැය නොවූ බැවින් ඒ සඳහා වෙන් කළ වියදම් වෙන් වූ රු.20000 ක මුදල ඉතිරි වීම. |
| 4. ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ තුළ ප්‍රමාණවත් නොවන කාන්තා දායකත්වය පිළිබඳ සමීක්ෂණය | 328-1-1-1-2502-1 | 475000 | 42962 | 432038 | දත්ත විශ්ලේෂණය සහ වාර්තාව ලිවීම යන කාර්යයන් බාහිර පාර්ශවයක් වෙත පැවරීමද ඇතුලත්ව මෙම මුදල් ඇස්තමේන්තුව සකස් කරන ලදී. එහෙත් ඇස්තමේන්තුව පිළියෙළ කළ කාලවකවානුවේ එම කාර්යයන් සඳහා පැවති වෙළඳපොළ මිල ගණන් වලට වඩා සත්‍ය වශයෙන්ම එම කාර්යය පවරන කාලවකවානුව වන විට එය ඇස්තමේන්තු කළ වියදමට වඩා වැඩි අගයක් ගනී.එබැවින් යථෝක්ත කාර්යයන් බාහිර පාර්ශවයක් වෙත නොපවරා ශ්‍රම වෙළඳපොළ කාර්ය මණ්ඩලය විසින්ම සිදු කරන බැවින් මෙම මුදල් ඉතිරි වීමට හේතු විය. |
| 5. ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සඟරාව ප්‍රකාශයට පත් කිරීම. | 328-1-1-1-2401 | 570000 | | 570000 | 2012 වසරේදී ශ්‍රම වෙළඳපොළ පිළිබඳ අධ්‍යයනය නොකළ බැවින් 2013 වසරේදී ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව ප්‍රකාශයට පත් නොකරන ලදී. එම නිසා 2013 වසරේ ශ්‍රම වෙළඳපොළ පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමෙන් 2014 මුල් කාර්තුවේදී එම සඟරාව ඉදිරිපත් කරනු ලැබේ. |
| 6. පාසැල් පාදක දත්ත අත්පොත | 328-1-1-1-2401 | 250000 | | | මුද්‍රණය කිරීමට නියමිත පොතෙහි පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා පාලන අංශය වෙත භාර දී ඇත. |

## 3.6. රැකියා සේවා මධ්‍යස්ථාන (Job Assistance Centers)

### 3.6. (i) පසුබිම

රාජ්‍ය හා පුද්ගලික අංශවල හවුල් ව්‍යාපෘතියක් ලෙස අංක අමප/03/0874/130/23 EPD/464 හා 2003.10.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රැකීරක්ෂා සේවා මධ්‍යස්ථාන ජාලය (රැකියා පියස) 2003 වර්ෂයේදී ස්ථාපනය කරන ලදි. ජාතික රැකීරක්ෂා ප්‍රතිපත්තියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරු සබඳතා හා රැකීරක්ෂා අමාත්‍යාංශය යටතේ මෙම ආයතනය පුළුල් පරාසයක් තුළ ලබා විය හැකි පරිගණක පද්ධතියක් හරහා සියලු මධ්‍යස්ථාන එකිනෙකට සම්බන්ධ කරන ලදි. මුලින් විදේශ ආධාර ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ එය 2007.01.31 දක්වා ක්‍රියාත්මක විය. අනතුරුව කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශ විසින් 2007.01.24 දින ඉදිරිපත් කල අංක 2/2007 අමාත්‍ය මණ්ඩල සන්දේශයට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා රැකියා පියස ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදි.

2010 වර්ෂයේදී එම විෂය පථය කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිටවූ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට පැවරුණු අතර, ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 03/2011 හා 2011.02.15 දිනැති සංදේශයට අනුව රැකියා පියස ප්‍රතිව්‍යුහගත කිරීමට අදාලව ඉදිරිපත් කරන ලද කරුණු සඳහා 2011 මැයි මස 12 දින තීරණය මගින් අනුමැතිය ලැබී ඇත.

6/2011 අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලැබුණු තීරණ වලට අනුව Job net ඇපයෙන් සීමිත සමාගම යටතේ පැවතුනු දිස්ත්‍රික් රැකියා පියස මධ්‍යස්ථාන මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව යටතට පවරා ගන්නා ලදි. ඉන් පසුව දෙපාර්තමේන්තුව යටතේ ඇති කරන ලද දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථාන වෙත රැකියා පියස මධ්‍යස්ථාන සතුව තිබූ භෞතික සම්පත් ද පවරා දෙන ලදී. මෙසේ පිහිටුවනු ලැබූ දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථාන 17 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වාගෙන යමින් දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගනිමින රාජ්‍ය රැකියා සේවාව සැපයීමට අදාල කටයුතු ඉටුකරමින් පවති.

### 3.6. (ii) රාජ්‍ය රැකියා සේවාවේ අරමුණු

- රැකියා සම්බන්ධීකරණය.
- ශ්‍රම වෙළඳපොල තොරතුරු ඒකකය.
- ශ්‍රම වෙළඳපොල වැඩසටහන්
- රැකියා වියුක්තිකයින් සඳහා ප්‍රතිලාභ සැළසීමේ ක්‍රමවේදයන්
- පුහුණු සඳහා යොමු කිරීමේ සේවාවන්
- PES මධ්‍යස්ථාන සම්බන්ධිත පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය.
- පෞද්ගලික අංශයේ රැකියා නියෝජිත ආයතන ලියාපදිංචි කිරීම හා සම්බන්ධීකරණය.


### 3.6. (iii) රැකියා සේවා මධ්‍යස්ථානය මඟින් ඉටු කරන කාර්යයන්

- රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම.
- රැකියා ඇබෑර්තු ලබා ගැනීම සහ එම ආයතන ලියාපදිංචි කිරීම.
- රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.
- ඇබෑර්තු සහ රැකියා අපේක්ෂිතයින් ගැලපීම සහ ආයතන වලට සම්මුඛ පරීක්ෂණ සඳහා යොමු කිරීම.
- රැකියාගත කිරීම් සහ පසු විපරම් කටයුතු.
- ජනාධිපත් ලේකම් කාර්යාලයෙන් යොමු කරනු ලබන රැකියා අපේක්ෂිතයින් සඳහා පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීම සහ අදාල සේවා සැපයීම.
- වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම.
- රැකියා අපේක්ෂිතයින් පුහුණු සඳහා යොමු කිරීම.

රැකියා අපේක්ෂිතයින් සොයා ගැනීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිටින මානව සම්පත් සංවර්ධන නිලධාරීන් මඟින් රැකියා ගවේශන වැඩසටහන් රැකියා පොළ (ප්‍රාදේශීය සහ දිස්ත්‍රික්) හා කාර්යාලයට පැමිණෙන අපේක්ෂිතයන් ලියාපදිංචිය මඟින් සිදු කරනු ලැබේ. රැකියා අපේක්ෂිතයින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා ඔවුන්ගේ රැකියා අපේක්ෂාවන් හඳුනා ගෙන අවශ්‍ය වෘත්තීය මාර්ගෝපදේශ සැපයීම, දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් හා සම්බන්ධීකරණයෙන් සිදු කරනු ලැබේ.

❖ **වර්තමානයේ පහත සඳහන් ස්ථාන වල රැකියා සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ.**

1. අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
2. අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
3. බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
4. මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
5. කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
6. ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
7. ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
8. තංගල්ල පාදේශීය ලේකම් කාර්යාලය
9. කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
10. මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
11. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
12. කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
13. මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
14. මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
15. රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
16. මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
17. යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය



## 3.6 (iii) රැකියා සේවා මධ්‍යස්ථාන වල කාර්ය සාධනය

2013 වර්ෂයේදී දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථානයන්හි කාර්ය සාධනය

| දිස්ත්‍රික්කය | රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචිය | රැකියා පුරප්පාඩු ලියාපදිංචිය | රැකියා ගැලපීම | රැකියාගත කිරීම |
|---|---|---|---|---|
| කොළඹ | 2818 | 1664 | 2830 | 150 |
| ගම්පහ | 2870 | 1654 | 2613 | 475 |
| හම්බන්තොට | 1834 | 1145 | 943 | 218 |
| මාතර | 2603 | 678 | 2133 | 349 |
| මහනුවර | 2268 | 425 | 912 | 262 |
| කෑගල්ල | 1838 | 1186 | 1676 | 382 |
| කුරුණෑගල | 4912 | 1191 | 2814 | 443 |
| රත්නපුර | 1161 | 187 | 287 | 66 |
| කලුතර | 2142 | 1268 | 1264 | 267 |
| ගාල්ල | 1470 | 450 | 1364 | 246 |
| අනුරාධපුර | 778 | 473 | 518 | 207 |
| අම්පාර | 1790 | 758 | 569 | 347 |
| මඩකලපුව | 2474 | 305 | 1271 | 177 |
| බදුල්ල | 2034 | 2449 | 2105 | 248 |
| මොණරාගල | 760 | 192 | 447 | 83 |
| යාපනය | 1774 | 1946 | 1896 | 423 |
| මාතලේ | 537 | 417 | 154 | 111 |
| පුත්තලම | 152 | 30 | 40 | 18 |
| නුවර එළිය | | | | |
| පොළොන්නරුව | 54 | 15 | 17 | 9 |
| මන්නාරම | | | | |
| කිලිනොච්චිය | | | | |
| ත්‍රිකුණාමලය | | | | |
| වවුනියාව | | | | |
| මුලතිව් | | | | |
| එකතුව | 34272 | 16433 | 23882 | 4481 |

### 3.6.(iv) රැකියා ගත කිරීම්

1) රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන් මඟින් - 7389

2) රැකියා සේවා මධ්‍යස්ථානය - රැකියා පියස - 4416

3) ග්‍රාමීය රැකියා ව්‍යාපෘතිය මඟින් - 81

## 3.7. දෙපාර්තමේන්තු ප්‍රකාශන

මෙම දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය තුළ එළිදක්වන ලද සඟරා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

- හසර සඟරාව (ප්‍රකාශන 03 සඳහා) - රු.362,320.00 (වැයකළ මුදල)
- පාසල් පාදක සමාජ ආර්ථික දත්ත අත්පොත (අත්පොත් 3500 ක්) - රු. 135600.00

